
# දොඹගස්කන්දේ අසිරිමත් වන පියස

**වසන්ත කරුණාතිලක**
(පොදු උපසභාපති)
ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය දෙහිවල.

ලෝකයේ ඇති තිවර්තන වැසි වනාන්තර අතුරින් අප රටේ ඇති සිංහරාජ වනයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. එය අපේ පමණක් නොව මුළු මහත් ලෝක ප්‍රජාවගේම උරුමයක් බව දැන් සනාථ වී හමාරය. එලෙසම අප රටේ දැනට ඉතිරිව ඇති 8% ක් පමණ වන ඝෝෂ වනාන්තර අතුරින් වැදගත් ම ස්ථානය සිංහරාජයට හිමි වී ඇතත් එයට නෑකම් කියන ජෛව විවිධත්වයෙන් අතිශය වැදගත් වූ වන පියසි රැසක් අපට හිමිව තිබෙන බවට අප ආඩම්බර විය යුතුය. ප්‍රමාණයෙන් එතරම් විශාල නොවූවත් අප රටේ තෙත් කලාපය තුළ මෙවැනි මනරම් වන පියසි සැලකිය යුතු ගණනක් පවතී. මේ අතුරින් දොඹගස්කන්ද රක්ෂිතය කොළඹට සැතපුම් තිහක් [30] ක් පමණ දුරින් පවතින බෞද්ධ ආරණ්‍යයකට සෙවන සදන රමණීය භූමි භාගයකි.

දොඹගස්කන්ද රක්ෂිතය කළුතර දිස්ත්‍රික්කයට අයත්ව, හොරණ-රත්නපුර මාර්ගයේ ඉංගිරිය නගරයට ආසන්නව පිහිටා ඇති අතර, මෙහි මායිම් ලෙස නැගෙනහිරින්




ඉංගිරිය ඇළ ද, දකුණින් කළු ගඟ ද, බටහිරින් රත්නපුර - හොරණ මාර්ගයේ [A8] සිට කළු ගඟ දක්වා දිවෙන ඇළ හා උතුරින් දොඹගස්කන්ද ගම්මානය හරහා වැටී ඇති මාර්ගය ද නම් කළ හැකිය. මුහුදු මට්ටමේ සිට මීටර් 20 ත් මීටර් 200 ත් අතර උස් වූ බිම් ප්‍රමාණයක විහි දී ඇති මෙම භූමි භාගය ප්‍රමාණයෙන් අක්කර 650 ක් තරම් යැයි ලේඛනවලින් පෙන්වා දෙයි. 1929 දී රක්ෂිතයක් ලෙස අක්කර 850 ක් පමණ ප්‍රදේශයක් නම් කරන ලද නමුත් වර්තමාන තත්ත්වය ගැන සලකන විට එහි පැවැත්මට දැඩි ලෙස තර්ජනයන් එල්ල වී ඇති බවක් පෙනේ.

මෙම වන පියසේ ඉතිහාසය දෙස බලන කල එය ආරණ්‍යයත් සමඟම දශක ගණනාවක්ම සිට පැවතගෙන එන්නක් බව පැහැදිලි ය. තව ද මෙයට සැතපුම් 04 ක් පමණ ආසන්නයේම පිහිටි 'පාහියන් ගල' නමැති ස්ථානයෙන් වසර 34,000 ක් තරම් පැරණි ලංකාවේ ආදිතම මනුෂ්‍යයාගේ යැයි සැලකෙන නෂ්ඨාවශේෂ හමුවීම මෙහි ඉතිහාසයට සම්බන්ධ වැදගත් කරුණකි. දැනට මෙහි වැඩ වසන ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාගෙන් ද, ගම්වාසී ජනයාගෙන් ද ඉතිහාසයට සම්බන්ධ වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකිය.

දැනට ආරණ්‍යය ආශ්‍රිතව ඇති ස්වාභාවික වනාන්තරයට අමතරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කරන ලද නැවත වන වගාවන්ගෙන් ද ඉහත දී වන විනාශයට ලක්වී ඇති යැයි සැලකිය හැකි කළු ගඟ ආශ්‍රිත වගුරු බිම්වලින් ද ගම්වාසීන් විසින් අනවසරයෙන්

කරන ලද වගාවන් හා පදිංචි ඉඩම්වලින් ද මූලික වශයෙන් සමන්විත වූ මෙම පරිසර පද්ධතිය එකිනෙකට සමාන නොවන කලාප කීපයකට වෙන් කළ හැකිය. මෙම ස්වභාවික වනාන්තරයේ මූලික ලක්ෂණය වනුයේ හොර කුළයේ (Dipterocarpus) ශාක වැඩි ගහණයකින් යුක්ත වීමයි. වියන් ස්ථරයේ වැඩි කොටසක් වසා සිටින මෙම ශාකයන් උසින් මීටර් 30 ක ප්‍රමාණයෙන් යුක්ත වන අතර බඳේ සාමාන්‍ය විශ්කම්භය මීටර් 01ක් පමණ වේ. මීට අමතරව නැවත කරන ලද වන වගාව සඳහා පයිනස් (Pinus Caribaea), ඇල්බීසියා (Albizia Sp), මැහෝගනී (Swieteia Mahogany) යන වර්ගවල ශාක උපයෝගී කොට ඇත. තව ද වනයේ බොහෝ ප්‍රදේශවල පහළ ස්ථරයන් බට පඳුරු වලින් අවරණය වී ඇති අතර, කළු ගහ ආසන්නයේ ම උණ පඳුරුවලින් ගහණය මෙහි ගහ අසබඩ පහත් බිම් වසරේ ටික කලක් ගංවතුරට යට වී පවතින අතර ඒ ආශ්‍රිත ප්‍රදේශ තෘණවලින් ගහණ වගුරු බිම් ලෙසට පත්වී ඇත.

ජීවි ඝනත්වය අතින් අතිශය වැදගත්කමකින් යුක්ත වූ මේ රක්ෂිතයේ පක්ෂි විශේෂ 151 ක් වාර්තා වී ඇත. මින් විශේෂ 9ක්ම ශ්‍රී ලංකාවට ආවේනික වේ. දත්ත පොතේ අඩංගු සත්ත්ව විශේෂ පහක්ම දොඹගස්කන්ද රක්ෂිතයෙන් හමුවීම මෙය වහා සංරක්ෂණය කළ යුතු බවට කදිම සාක්ෂියකි. ශ්‍රී ලංකාවේ දුර්ලභම පක්ෂියා යැයි සැලකෙන බට ඇටි කුකුළා (Centrophus Chlororhynchus) මෙහි දී හමුවීම රක්ෂිතයේ වැදගත්කම මොනවට කියාපායි. තව ද ශ්‍රී ලංකාවේ හමු වූ දුර්ලභතම මත්ස්‍ය විශේෂයක් වූ පුල්ලි අභිරාවා (Lepidoupalicthys Jonklaasi) මෙම රක්ෂිතයේ දක්නට ලැබීම මහත් වැදගත් කරුණකි. මේ සත්ත්ව විශේෂ දෙක හැරුණු කොට තව මත්ස්‍යය විශේෂ තුනක් වන ලේ තිත්තයා (Puntius titteys), පුළුට්ටා (Belontia signata), දෙපුල්ලියා (Puntius cumingii) ද මෙහි දක්නට ලැබේ. උභය ජීවීන් ගැන සඳහන් කරන විට ශ්‍රී ලංකාවට ආවේනික උභය ජීවී ගණයක් වන Nannophrys ගණයේ ගල්පර මැඩියා (Nannophrys guntheri) විශේෂය ද වාර්තාවීම විශේෂිත කරුණකි. මේ හැරුණු විට මෙහි ක්ෂීරපායි විශේෂ 15 ක් පමණ වාර්තා වී ඇති අතර මින් ලංකාවට ආවේනික කොළ වඳුරා (Presbytis senex), රිළවා (Macaca sinica) ඇතුළුව දඬු ලේනා ද (Retufa macroura) සුලභව දැක ගත හැකිය.



මෙහි දී හමුවන උරග විශේෂ විසි හත [27] අතුරින් දහයක්ම [10] ලංකාවට ආවේනික වන අතර, උභය ජීවී විශේෂ දාසය [16] අතුරින් හයක්ම [6] ලංකාවට ආවේනිකය.

ශ්‍රී ලංකාවේ සිටින මත්ස්‍ය විශේෂ 72 ක් වූ සංඛ්‍යාවෙන් 36 ක්ම මෙ ප්‍රදේශයේ දැකගත හැකි වන අතර මින් විශේෂ නවයක් ම [09] අපට ආවේනිකය. මේ දත්තයන් ගැන සලකා බලන කල හුදෙකලා වූ තෙත් වනාන්තරවල ජීවි විවිධත්වය හා ඒවායේ අතර ඇති සුවිශේෂ වැදගත්කම ඉතාමත් පැහැදිලි ලෙස මේ රක්ෂිතයෙන් අනාවරණය වේ.

මෙහි අපෘෂ්ඨවංශිකයන් ගැන සලකන විට වැඩිම විශේෂ විවිධත්වයකින් යුත් කොටසක් වන සමනලුන් හා සලඹයන් විශේෂ 75 කට නොවැඩි සංඛ්‍යාවක් හමුවී

ඇත. ඒ අතර Troides helena, සහ Papilio polymnestor ලංකාවට ආවේනික යැයි සැලකිය හැකිය. තව ද මෙහි සිටින කෘමි විශේෂ ගැන වඩා විධිමත් අධ්‍යයනයක් කිරීම මේ සත්ත්ව විශේෂයන්ගේ පැවැත්මට ඉතාමත් ඉවහල් වන බව කිව යුතුය.

දොඹගස්කන්ද රක්ෂිතයේ වැදගත්කම උඩවැඩියා සම්බන්ධයෙන් ද ඉතා ඉහළ මට්ටමක පවතී. දැනට එහි වාර්තා වී ඇති 20 ක් පමණ වූ විශේෂ අතරට ලංකාවට ආවේනික ඉරුරාජ (Zeuxine regia), වෙසක් මල් (Dendrobium maathie) ද අයත් වී ඇත. ආවේනික උඩවැඩියා විශේෂ 7ක් අයත් වන දොඹගස්කන්ද රක්ෂිතයේ තුන්සීයකට (300) පමණ අනුමාන කළ හැකි ශාක විශේෂ සංඛ්‍යාවක් පවතී. මින් වැඩි කොටසකගේ අධ්‍යයන වර්තමානයේ සිදු කෙරෙමින් පවතින නිසා ඉදිරියේ දී තව තවත් විශේෂිත හඳුනා ගැනීමට හැකිවනු ඇත.

දොඹගස්කන්ද ආශ්‍රිත ගම්මානයේ පවුල් 350කට පමණ අයත් 1500 ක් පමණ ජන කොටසකගේ විවිධාකාර වූ බලපෑම්වලට නිරතුරුවම මෙම රක්ෂිතයට මුහුණ දීමට සිදු වී ඇත. මෙහි ගම්වාසීන්ගෙන් වැඩි දෙනා ගොවිතැනින් ජීවත්වන අතර වී වගාවන් ද හේන් සහ ගෙවතු වගාවන් ද මෙහි මූලික තැනක් ගනී. හේන් වගාවන් හා අනවසර පදිංචිය නිසා ද වනාන්තරය ක්‍රම ක්‍රමයෙන් ප්‍රමාණයෙන් අඩුවෙමින් පවතී. හේන් වගාවන් කිරීමේ දී කරනු ලබන ගිනිතැබීම් නිසා ද වනයට හානිවූ අවස්ථා එමටය. තව ද වනාන්තරය සතු බට පඳුරු කපා ඉවත් කිරීම ද, උණ ගස් කැපීම ද නිරතුරුවම සිදුවන විනාශයන්ට දායක වේ. මේවා අමුද්‍රව්‍ය වශයෙන් විකිණීමෙන් ද ගෘහ කර්මාන්තයන් ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් ද ගම්වාසීන් අමතර ආදායමක් උපයා ගනිති. රැකියාවක් වශයෙන් කරනු ලබන කාර්යයක් ලෙස සැලකිය හැක්කේ රබර් කිරි කැපීමය. ප්‍රජා අවශ්‍යතාවන් ඉතාමත් අවම මට්ටමක පවතින මෙම ප්‍රදේශයේ එක් ප්‍රාථමික පාසලක් හා ළදරු පාසලකින් පමණක් අධ්‍යාපනික අවශ්‍යතාවන් සපුරා ගැනේ. එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා විශේෂයෙන් දර හා දැව ප්‍රයෝජනයට ගැනීම ද රක්ෂිතයේ බටහිර මායිමට ආසන්නව කළුගල කඩා ඉවත් කිරීම ද මෙහි දක්නට ඇති කාර්යයන් දෙකකි.

බාහිරින් එල්ලවන තර්ජනයන් ලෙස විශේෂ අවධානයක් යොමු කළ යුතු අවස්ථා කීපයක් මෙහි දී හඳුනා ගත හැක. එනම් අපනයන සඳහා මහා පරිමාණව එක් රැස් කිරීමට ලක්වී ඇති දුර්ලභ මසුන් ඇල්ලීම ද, ආකර්ශනීය පෙනුමැති කළු ගල් කඩා ඉවත් කිරීම ද, ජාවාරම්කරුවන් විසින් දැව කපා ඉවත් කිරීම ද, ඉතා වැදගත් කොට සැලකිය යුතුව ඇත. මෙම තත්ත්වයන් යටතේ සාපේක්ෂ වශයෙන් කුඩා භූමි ප්‍රමාණයක් වූ දොඹගස්කන්ද රක්ෂිතයට මෙවන් තර්ජනයන් ඉතාමත් දැඩි ලෙස බලපාන බව කාහට වුව ද පැහැදිලි ය. ඒ අනුව මෙහි පැවැත්ම සඳහා ගතයුතු පියවර කල්පනාකාරීව කළ යුතුය.

මෑතක් වන තුරු වැඩි පිරිසකගේ සැලකිල්ලට භාජනය නොවූ මෙම වන පියස ජාතික සත්ත්වෝද්‍යානයේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ සාමාජික සාමාජිකාවන් පිරිසක් විසින් 1990 සිට 1992 දක්වා කරන ලද සමීක්ෂණයකින් පසුව එහි ප්‍රතිඵල මූලික අධ්‍යයන වාර්තාවක් ලෙස එළි දැක්වීමෙන් අනතුරුව මෙහි වැදගත්කම වගකිවයුතු අංශවල අවධානයට යොමු වී ඇත. ඇත්තවශයෙන්ම මෙහි ශාක ප්‍රජාව ගැන තවදුරටත් අධ්‍යයනයන් ඇවැසි බවක් මෙම වාර්තාවෙන් පෙන්නුම් කරන අතර විශේෂයෙන් ක්ෂීරපායීන්ගේ වැඩිදුර අධ්‍යයනයක් ද අපෘෂ්ඨ වංශීන්ගේ විශේෂිත අධ්‍යයනයක් ද මෙහි වසන ජෛව ප්‍රජාවේ අනාගත සුරක්ෂිතභාවය තහවුරුකරනු ඇත. දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින දොඹගස්කන්ද රක්ෂිතයේ මේසා විශාල වූ වැදගත්කම වටහාගත් පරිසරවේදීන් මෙය දැඩි රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කරවනු පිණිස තම අවධානය යොමු කර සිටියි. මෙහි දී ඉතා වැදගත් වනුයේ වනය හා ආරණ්‍යය අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාව මනා ලෙස වටහා ගැනීමත් අවට ගම්වාසීන්ගේ ජීවන රටාවනට විකල්ප සපයාදීමත්ය. ඒ අතර වනය සුරැකීම සඳහා එහි මායිම නිසි ලෙස පවත්වාගෙන යාමටත් වන විනාශයන් හා පරිසර විනාශයන් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමටත් අවශ්‍යව ඇත. මේ සමගින්ම දැනට විනාශ වී ගිය වනය නැවත වන වගා කිරීමේ දී පයිනස්, ඇල්බීසියා වෙනුවට දේශීය විශේෂ එක් කිරීමත්, ක්‍රමයෙන් ස්වාභාවික වනයක් ලෙස පත්වන ප්‍රදේශ එලෙසින්ම පැවතීමට ඉඩ ඇරීමත් යන උපක්‍රම භාවිතයට ගැනීමෙන් ස්වාභාවික වනයේ ආරක්ෂාව තහවුරු වනු ඇත. තව ද ගම්වැසියන්ගේ එදිනෙදා දැව අවශ්‍යතාවය සඳහා සහ බට ගැනීමට වෙන් කෙරුණු භූමියන් නම් කිරීමෙන් ස්වාභාවික වනයට එල්ලවන තර්ජන අවම කරගත හැකිවනු ඇත.

අවසන් වශයෙන් මෙම අසිරිමත් වන පියසේ අනාගත පැවැත්ම තහවුරු වනු දැකීම අප සැමගේ බලාපොරොත්තුව වන අතර, මේ මගින් දහස් ගණන් වනජීවීන් හා ගහ කොළ නොනැසී පවතිනු ඇතැයි විශ්වාස කළ හැක. එබැවින් මෙතුළින් මෙහි අනාගතය සඳහා නීතිමය අවශ්‍යතාවයන්ද සමාජයීය අවශ්‍යතාවයන්ද වගකිව යුතු අංශවලින් ඉටුකර ගැනීම පරිසරවේදීන් වන අප සැමගේ එකම බලාපොරොත්තුව වනු නොඅනුමානය.

ආශ්‍රිත ග්‍රන්ථ:
'සිත්මුවා' 92 - ශ්‍රී. ලං. ත. ස. සං.
Fauna & Flora of Dombagaskanda Forest Reserve ශ්‍රී. ලං. ත. ස. සං.
'රණිවුඩය' කලාපය - දෙසැ.-පෙබ. 92/93 - ශ්‍රී. ලං. ත. ස. සං.